නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
சுதந்திர ஊடக இயக்கம்
Free Media Movement
FMM SRI LANKA

# මාධ්‍ය නිදහසඃ නිරීක්ෂණ වාර්තාව

## ஊடக சுதந்திரம்: கண்காணிப்பு அறிக்கை

## Media Freedom Rights Monitoring Report

MFRMD

# 2021 අගෝස්තු

කලාප අංක 08


වෛද්‍ය ජයරුවන් බණ්ඩාර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත කැඳවීම


ලංකා ඊ නිව්ස් මාධ්‍යවේදී කීර්ති රත්නායක අත්අඩංගුවට ගැනීම


වෛද්‍ය නජිත් ඉන්දික, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ප්‍රශ්න කිරීමට ලක් වීම

**මාධ්‍ය නිදහසට අදාළව ඒ ඒ මාසය තුළ වාර්තා වන සිදුවීම් හා පූර්ව සිදුවීම්වලට අදාළ වර්ධනයන් සම්බන්ධ කෙටි වාර්තාකරණයක් සහ ඒවාට අදාළ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ. මාධ්‍යවේදීන්ගේ මෙන්ම ජනතාවගේ භාෂණයේ හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සම්බන්ධ සිදුවීම් කෙරෙහිද මෙහිදී අවධානය යොමු කර ඇත. මාධ්‍ය නිදහස පිළිබඳව නිරීක්ෂණය කිරීම සඳහා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය තෝරා ගෙන ඇති විෂය පථයට/ සංරචකයන්ට අදාළ සිදුවීම් 17ක් අගෝස්තු මාසය තුළ නිරීක්ෂණය විය. අදහස් පළ කිරීමේ අයිතියෙහි එක් ස්වරූපයක් වන උද්ඝෝෂණය කිරීමේ අයිතියට එරෙහිව පොලිසිය විවිධ අණ පනත් අවභාවිත කිරීමේ හා අනීතිකව කටයුතු කිරීමේ ප්‍රවණතාව මෙම කාලය තුළ වඩාත් කැපී පෙනිණි. ජනමාධ්‍යය වෙත අදහස් පළ කිරීම හේතුවෙන් විවිධ ක්ෂේත්‍රවල ක්‍රියාකාරීන්ගෙන් ප්‍රශ්න කිරීමේ මෙන්ම අත්අඩංගුවට ගැනීමේ අවස්ථාද නිරීක්ෂණය විය.**

**උද්ඝෝෂණවල නිරත වූ ක්‍රියාකාරීන් අත්අඩංගුවට ගැනීමට විරෝධය පළ කරමින් නිදහස් මාධ්‍ය ව්‍යාපාරය නිවේදනයක් නිකුත් කළ අතර සිදුවීම් දෙකකට අදාළව නිදහස් මාධ්‍ය ව්‍යාපාරයද ඇතුළත් මාධ්‍ය සංවිධාන එකතුව විසින් පොලිස්පතිවරයා වෙත විවෘත ලිපි යොමු කෙරිණි.**

## අගෝස්තු මාසය තුළ වාර්තා වූ සිදුවීම්

1. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ නිකුත් කළ නව ගැසට් නිවේදනයට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් අතුරු තහනමක් පැනවීම.
2. උද්ඝෝෂණයකට සහභාගී වී ආපසු යමින් සිටි ගුරුවරුන් 36 දෙනෙකු ඇතුළු 44 දෙනෙකු පොලිසිය මගින් අත්අඩංගුවට ගැනීම.
3. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් පොලිස්පතිවරයා වෙත යොමු කරන ලද ලිපිය ප්‍රකාරව උද්ඝෝෂණයක් තහනම් කිරීමට පොලිසිය කළ ඉල්ලීමක් අධිකරණය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීම.
4. තමිලන් පුවත්පතේ කර්තෘ ආර්. සිවරාජා පදිංචි නිවාස සංකීර්ණයට ඇතුළු වීමට පොලිසියෙන් යැයි හඳුන්වා දුන් පිරිසක් උත්සාහ දැරීම.

5. ලංකා ඊ නිව්ස් වෙබ් අඩවියේ මාධ්‍යවේදී කීර්ති රත්නායක අත්අඩංගුවට ගෙන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ දින 90ක රැඳවුම් නියෝගයක් මත රඳවා තබා ගැනීම.

6. සමාජමාධ්‍ය ක්‍රියාකාරිනියක වන තුෂාරා වන්නිආරච්චිගේ නිවස පරීක්ෂා කළ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඇයට අයත් සන්නිවේදන උපකරණ අත්අඩංගුවට ගැනීම හා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත කැඳවා ඇයගෙන් ප්‍රශ්න කිරීම.

7. 'අද දෙරණ' ප්‍රාදේශීය මාධ්‍යවේදී සුමේධ සංජීව, පැලවත්ත ප්‍රදේශයේ වාර්තාකරණයක නිරතව සිටියදී සිවිල් පුද්ගලයකුගේ ප්‍රහාරයකට ලක් වීම.

8. අවිස්සාවේල්ල රෝහලේ වෛද්‍ය නජිත් ඉන්දික, කොවිඩ් ආසාදිතයින් මුහුණ පා සිටින තත්ත්වය පිළිබඳව සිය අත්දැකීම් ෆේස්බුක් සමාජජාලයේ පළ කිරීම හේතුවෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ප්‍රශ්න කිරීමට ලක් වීම.

9. මාධ්‍යවේදී විමුක්ති දුෂාන්ත, යුද්ධ හමුදා වෙබ් අඩවියෙහි පළ වූ පුවතක් පිළිබඳව සිය ෆේස්බුක් ගිණුමේ පළ කළ විවේචනයක් හේතුවෙන් හමුදා නිලධාරියකුගේ තර්ජනයට ලක් වීම.

10. ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ජාතික සේවක සංගමයේ සභාපති ආනන්ද පාලිත, ජනමාධ්‍යයට කළ ප්‍රකාශයක් හේතුවෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගැනීම.

11. කොතලාවල පනතට එරෙහි සිසු උද්ඝෝෂණයට සහභාගි වීම හේතුවෙන් ලංකා වතු සේවා සංගමයේ සභාපති චතුර සමරසිංහ පසුපස පොලිසිය ලුහුබැඳීම.

12. පොලිසියෙන් බව පවසමින් මාධ්‍යවේදී තරිඳු උඩුවරගෙදරගේ පෞද්ගලික තොරතුරු ලබා ගැනීම පිළිබඳව ඔහු පොලිස්පතිවරයාට පැමිණිලි කිරීම.

13. දුරකථන සමාගමකින් බව පවසා සිය පෞද්ගලික තොරතුරු ලබා ගැනීමේ උත්සාහයක් පිළිබඳව, අනිද්දා පුවත්පතේ නියෝජ්‍ය කර්තෘ ලසන්ත රුහුණගේ පොලිස්පතිවරයාට පැමිණිලි කිරීම.

14. මාධ්‍ය සාකච්ඡාවකදී කළ ප්‍රකාශයක් හේතුවෙන් වෛද්‍ය ජයරුවන් බණ්ඩාර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත කැඳවීම.

15. ශ්‍රී ලංකාවේ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාත්මක වී වසර පහක් සපිරීම නිමිත්තෙන්, ශ්‍රී ලංකා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව, මහජන සුබසිද්ධිය පිළිබඳ තෝරා ගත් නියෝග එකතුවක් එළිදැක්වීම.

16. නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සම්පාදනය කළ, '2020 ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහස වාර්ෂික වාර්තාව- සිදුවීම් සහ ප්‍රවණතා' එළිදැක්වීම.

17. නිදහස් මාධ්‍ය ව්‍යාපාරය විසින් මාසිකව පළ කරනු ලබන 'මාධ්‍ය නිදහස නිරීක්ෂණ වාර්තාව' මගින් ඉකුත් මාස 7ක කාලය තුළ ආවරණය කළ සිදුවීම් පාදක කර ගනිමින් 'අදහස් පළ කිරීමේ නිදහස සහ මර්දනය' යන තේමාව යටතේ මහජන සංවාදයක් පැවැත්වීම.

**1 වගුව: වාර්තා වූ සමස්ත සිදුවීම් - 2021 අගෝස්තු**

| අංකය | ආවරණය කර ඇති සංරචකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ආරක්ෂාව සහ සුරක්ෂිතබව | 08 |
| 02 | නීතිමය කොන්දේසි | 06 |
| 03 | ව්‍යුහාත්මක කොන්දේසි | 03 |
| | **එකතුව** | **17** |

## මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතබව

**මාධ්‍යවේදීන්ට තම වෘත්තිය ශාරීරික සහ මානසික ඒකාග්‍රතාවකින් යුක්තව නිදහස් ලෙස කර ගෙන යෑමේ වාතාවරණයක් පැවතීම ජනමාධ්‍ය නිදහස පිළිබඳ මූලික කොන්දේසියකි. එමෙන්ම ජනමාධ්‍ය නිදහස හා අදහස් පළ කිරීමේ නිදහස ආරක්ෂා වීමට නම්, පුරවැසියන්ට අනිටු ප්‍රතිවිපාකවලට මුහුණදීමේ අවදානමකින් තොරව ජනමාධ්‍ය ඔස්සේ හෝ වෙනත් ආකාරවලින් නිදහසේ අදහස් පළ කළ හැකි වාතාවරණයක් පැවතිය යුතුය. සාමාකාමීව රැස්වීමේ, විරෝධය පළ කිරීමේ හා උද්ඝෝෂණවල නිරත වීමේ නිදහසද අදහස් පළ කිරීමේ නිදහසට අයත්ය. මෙම මූලික නිදහස උල්ලංඝනය වූ අවස්ථා 8ක් අගෝස්තු මාසය තුළ දී නිරීක්ෂණය විය. මෙම සිදුවීම් සමස්තයක් ලෙස ගත කල, මාධ්‍ය නිදහසටත් අදහස් පළ කිරීමේ නිදහසටත් අහිතකර වාතාවරණයක් ක්‍රමයෙන් වර්ධනය වන බව පෙන්නුම් කරයි.**

**2 වගුව: 2021 අගෝස්තු: මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතබව - සිදුවීම් 08**

| අංකය | දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | පහරදීම | 01 |
| 02 | තර්ජනය කිරීම | 01 |
| 03 | මානසික බලපෑම් | 06 |
| | **එකතුව** | **08** |

1. **'අද දෙරණ' ප්‍රාදේශීය මාධ්‍යවේදී සුමේධ සංජීව, පැලවත්ත ප්‍රදේශයේ වාර්තාකරණයක නිරතව සිටියදී සිවිල් පුද්ගලයකුගේ ප්‍රහාරයකට ලක් වීම.**

අගෝස්තු මාසයේදී රට තුළ ඇති වූ ගෑස් හිඟය නිසා පාරිභෝගිකයන් අසීරුතාවට ලක් වීම පිළිබඳ වාර්තාකරණයක නිරතව සිටි 'අද දෙරණ' ප්‍රාදේශීය මාධ්‍යවේදී සුමේධ සංජීව, පැලවත්ත ඉන්ධන පිරවුම්හල අසලදී සිවිල් පුද්ගලයකුගේ පහරදීමකට ලක් විය. ගෑස් පෝලිම වීඩියෝගත කරමින් සිටියදී පිටුපසින් පැමිණි පුද්ගලයා මාධ්‍යවේදියාට පහර දෙන අවස්ථාව අදාළ වීඩියෝ දර්ශනයෙහි සටහන්ව තිබේ. මෙහිදී එම ස්ථානයේ සිටි පුද්ගලයකු මාධ්‍යවේදියාගේ ආරක්ෂාව වෙනුවෙන් පෙනී සිටීමද විශේෂයෙන් කැපී පෙනිණි. ප්‍රහාරයෙන් මාධ්‍යවේදියාගේ කැමරාවටද හානි වී ඇති අතර ඔහු තලංගම පොලිසියට අදාළ සිදුවීම පිළිබඳව පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබේ.

මූලාශ්‍රය: https://www.colomboxnews.com

2. **'තමිලන්' පුවත්පතේ කර්තෘ ආර්. සිවරාජා පදිංචි නිවාස සංකීර්ණයට ඇතුළු වීමට පොලිසියෙන් යැයි හඳුන්වා දුන් පිරිසක් උත්සාහ දැරීම.**

සීඅයිඩී නිලධාරීන් ලෙස පෙනී සිටි පුද්ගලයන් දෙදෙනෙක් තමන් හමුවීමට බව පවසමින් අගෝස්තු 12 වැනිදා අලුයම 2.30ට පමණ තම නිවස පිහිටි නිවාස සංකීර්ණයට ඇතුළුවීමට උත්සාහ දැරීම පිළිබඳව 'තමිලන්' පුවත්පතේ කර්තෘ ආර්. සිවරාජා පොලිස්පතිවරයාට පැමිණිලි කර ඇත.[1]

නිවාස සංකීර්ණයේ ආරක්ෂක නිලධාරියා ඔවුන්ගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇති අතර ඔවුන් බොහෝ වේලාවක් ඒ සඳහා බල කරමින් රැඳී සිට, තර්ජනය කර පිටව ගොස් තිබේ. සිවරාජා මේ සම්බන්ධයෙන් 12 වැනිදා උදේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් කළ විමසීමක දී පවසා ඇත්තේ එවැනි නිලධාරීන් කණ්ඩායමක් නොපැමිණි බවයි.

පොලිස්පතිවරයාට කළ පැමිණිල්ලෙන් පසු පොලිස් කණ්ඩායම් කිහිපයක් පැමිණ ඔහු සහ ඔහුගේ පවුලේ අයගෙන් කට උත්තර ගෙන ඇති අතර නිවාස සංකීර්ණයේ සීසීටීවී පරීක්ෂා කර බලා ඇත. ඒවා අක්‍රීයව තිබී ඇති බැවින් ඒ ආසන්නයේ ගොඩනැගිලිවල සීසීටීවී පරීක්ෂාවක්ද සිදු කර ඇත. ක්‍රියාත්මකව තිබූ එක් ස්ථානයක දර්ශන අනුව අදාළ වේලාව තුළ යතුරු පැදියකින් දෙදෙනෙකු ගමන් කරන බව පෙන්නුම් කර ඇතත් ඒවා ඉතා අපැහැදිලි බව ප්‍රකාශ වී ඇත.

මෙම සිදුවීමෙන් තමන් පමණක් නොව තම පවුලේ අයද එම නිවාස සංකීර්ණයේ සෙසු නිවාසවල පදිංචිකරුවන්ද බියට පත්ව සිටින බව සඳහන් කරන සිවරාජා, සීඅයිඩී වේශයෙන් වෙනත් කෙනෙක් සිය ජීවිතයට තර්ජනයක් එල්ල කිරීමට උත්සාහ කරනවාද යන්න ගැන තමන්ට සැකයක් ඇති බවද සඳහන් කරයි. තමන් පසුගිය දිනවල ආණ්ඩුව කෙරෙහි විවේචනාත්මක අදහස්, ලිපි හා පුවත් පළ කළ බවද මෙවැනි ක්‍රියාවලින් එම විවේචන වැළැක්විය නොහැකි බවද සිය ෆේස්බුක් ගිණුමේ පළ කළ සටහනක ඔහු සඳහන් කර තිබිණ.[2]

මූලාශ්‍රය:

1. https://theleader.lk 2. https://www.facebook.com

3. **අවිස්සාවේල්ල රෝහලේ වෛද්‍ය නජිත් ඉන්දික, කොවිඩ් ආසාදිතයින් මුහුණ පා සිටින තත්ත්වය පිළිබඳව සිය අත්දැකීම් ෆේස්බුක් සමාජජාලයේ පළ කිරීම හේතුවෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ප්‍රශ්න කිරීමට ලක් වීම**

අවිස්සාවේල්ල රෝහලේ සේවය කරන වෛද්‍ය නජිත් ඉන්දික, එම රෝහලේ කොවිඩ් රෝගීන් සම්බන්ධ අත්දැකීම් හා සෞඛ්‍ය කාර්යමණ්ඩල මුහුණ පා සිටින කනගාටුදායක තත්ත්වය විස්තර කරන සංවේදී සටහනක් අගෝස්තු 13 වැනිදා සිය ෆේස්බුක් ගිණුමෙහි[1] පළ කර ඇති අතර එය සමාජමාධ්‍ය තුළ මෙන්ම ප්‍රධාන ධාරාවේ මාධ්‍යවලද අවධානයට ලක් විය. 'පුළුවන්කමක් තියේනම් සියලු වැඩ නවත්තලා ගුහාගත වෙන්න, මිනිස්සු මැරෙන්නෙ මැස්සො වගේ' යනුවෙන් ඔහු එමගින් අවධාරණ කර තිබිණි. වෛද්‍ය නජිත් ඉන්දික සමාජ මාධ්‍ය ඔස්සේ විවෘතව අදහස් පළ කරන්නකු වන අතර, විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන සමයේ අන්තර් විශ්වවිද්‍යාලීය ශිෂ්‍ය බලමණ්ඩලයේ කැඳවුම්කරු ලෙසද ක්‍රියා කර ඇත.

ඉහත ෆේස්බුක් සටහන පළ වීමෙන් පසුව 15 වැනිදා

ඔහු හමු වීමට රෝහලට පැමිණි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දෙදෙනෙකු විසින් ඒ පිළිබඳව ඔහුගෙන් ප්‍රශ්න කරන ලදි. එදිනම රාජ්‍ය අමාත්‍ය චන්න ජයසුමන පාර්ලිමේන්තුවේදී වෛද්‍යවරයාගේ නම සඳහන් කරමින් ඔහු දැඩි දෝෂදර්ශනයට ලක් කළේය.[2] 'ෆේස්බුක්වල ලිය ලියා ඉන්නැතිව රෝගීන්ට ප්‍රතිකාර කරන්නැයි' රාජ්‍ය අමාත්‍යවරයා එහිදී කළ ප්‍රකාශය මෙන්ම රජයට පක්ෂ ඇතැම් මාධ්‍ය වෛද්‍ය නජිත් ඉන්දිකගේ සටහන උපුටා දක්වා තිබූ ආකාරය සම්බන්ධයෙන් ද සමාජමාධ්‍ය ඔස්සේ විවේචනය එල්ල විය.

මූලාශ්‍ර:

1. https://facebook.com 2. https://www.youtube.com

4. **මාධ්‍යවේදී විමුක්ති දුෂාන්ත, යුද්ධ හමුදා වෙබ් අඩවියෙහි පළ වූ පුවතක් පිළිබඳව සිය ෆේස්බුක් ගිණුමේ පළ කළ විවේචනයක් හේතුවෙන් හමුදා නිලධාරියකුගේ තර්ජනයට ලක් වීම.**

යුද හමුදා නිල වෙබ් අඩවියේ පළ වූ පුවතක්[1] සම්බන්ධයෙන් විවේචනාත්මක ප්‍රතිචාරයක් සිය ෆේස්බුක් ගිණුමේ පළ කිරීමෙන් පසුව අගෝස්තු 15 වැනිදා ඔහුගේ ජංගම දුරකථනයට ඇමතුමක් ගත් චමින්ද ලියනගේ නැමති යුද හමුදා කපිතාන්වරයකු එම ෆේස්බුක් සටහන සම්බන්ධයෙන් 'තර්ජනාත්මක හා බලපෑම් සහගත' ලෙස ප්‍රතිචාර දැක්වූ බව විමුක්ති දුෂාන්ත සඳහන් කරයි.[2] ඔහු infosrilanka.lk වෙබ් අඩවියෙහි කර්තෘ මණ්ඩල අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කරන අතර වෙබ් මාධ්‍යවේදීන්ගේ සංගමයෙහි (PWJ) විධායක කමිටු සාමාජිකයෙකි. අදාළ සිදුවීම පිළිබඳව ඔහු යුද හමුදාපතිවරයාටත්, පොලිස්පතිවරයාටත්, මානව හිමිකම් හා මාධ්‍ය නිදහස වෙනුවෙන් කටයුතු කරන දේශීය හා ජාත්‍යන්තර සංවිධානවලටත් පැමිණිලි කර ඇත.

මූලාශ්‍ර:

1. https://facebook.com 2. https://facebook.com

5. **දුරකථන සමාගමකින් බව පවසා සිය පෞද්ගලික තොරතුරු ලබා ගැනීමේ සැකසහිත උත්සාහයක් පිළිබඳව, අනිද්දා පුවත්පතේ නියෝජ්‍ය කර්තෘ ලසන්ත රුහුණගේ පොලිස්පතිවරයාට පැමිණිලි කිරීම.**

දුරකථන සමාගමකින් බව පවසා දුරකථනය ඔස්සේ තම තොරතුරු ඉල්ලා සිටීමක් සම්බන්ධයෙන් අනිද්දා පුවත්පතේ නියෝජ්‍ය කර්තෘ ලසන්ත රුහුණගේ පොලිස්පතිවරයාට පැමිණිලි කර තිබේ. අගෝස්තු 14 වැනිදා තම දුරකථනයට ඇමතුමක් ගත් කාන්තාවක්, දුරකථන සමාගමකින් දිනුමක් හිමි වී ඇති බව පවසමින් පෞද්ගලික තොරතුරු විමසූ බවත්, අදාළ සමාගමෙන් විමසූ විට එය ව්‍යාජ ඇමතුමක් බව සනාථ වූ බවත් එම පැමිණිල්ලේ සඳහන් වේ. ලසන්ත රුහුණගේ පොලිස්පතිවරයාගෙන් ඉල්ලා ඇත්තේ මෙය ලොතරැයි දිනුම් හිමිව ඇති බව පවසමින් මුදල් වංචා කිරීමේ ජාවාරමක් බව පැහැදිලි වන හෙයින් ඒ පිළිබඳ පියවර ගන්නා ලෙසයි. එහෙත් අදාළ සිදුවීම මාධ්‍යවේදියාගේ තොරතුරු ලබාගැනීමේ උපායමාර්ග යක්ද යන සැකය මෙම සිදුවීම පිළිබඳ වාර්තාවලින් සහ සමාජමාධ්‍ය ඔස්සේ පළ වූ අදහස්වලින් මතු කර තිබිණි.

මූලාශ්‍රය: https://satahan.blog

6. **කොතලාවල පනතට එරෙහි සිසු උද්ඝෝෂණයට සහභාගී වීම හේතුවෙන් ලංකා වතු සේවා සංගමයේ සභාපති චතුර සමරසිංහ පසුපස පොලිසිය ලුහුබැඳීම.**

අගෝස්තු 3 වැනිදා නිදහස් අධ්‍යාපනය උදෙසා සිසු ජන ව්‍යාපාරය විසින් පාර්ලිමේන්තු වටරවුමේදී පවත්වන ලද, කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල පනතට එරෙහි උද්ඝෝෂණයට සහභාගී වූ ලංකා වතු සේවා සංගමයේ (CESU) සභාපති චතුර සමරසිංහ පසුපස පොලිසිය ලුහුබඳිමින් සිටින බව අගෝස්තු 23 වැනිදා එම සංගමය නිවේදනයක් නිකුත් කරමින් ප්‍රකාශ කළේය. සංවිධානයේ කාර්යාලයට, රාජකාරි ස්ථානයට හා නිවසට පොලිසිය ඔහු සොයා ගොස් ඇති නමුත් කිසිදු පොලිස් ස්ථානයක පෙනී සිටින ලෙස නිල දැනුම්දීමක් කර නොමැති අතර චතුර සමරසිංහට එරෙහිව කිසියම් චෝදනාවක් සම්බන්ධයෙන් අධිකරණයට කරුණු වාර්තා කිරීමක්ද සිදු ව නැත.

ඉහත උද්ඝෝෂණයේදී පොලිස් නිලධාරියකුට තුවාල සිදු වීම හේතු ලෙස දක්වමින් ශිෂ්‍ය නායකයින් හා දේශපාලන ක්‍රියාකාරිකයින් අත්අඩංගුවට ගැනීමට පොලිසිය කටයුතු කළ අතර මෙම ලුහුබැඳ යෑමද එම ක්‍රියාදාමයේම කොටසක් බව පැහැදිලිව පෙනී යයි. වෘත්තීය සමිති රැසක් මෙම තත්ත්වයට විරෝධය පළ කරමින් දැක්වූ අදහස් පුවත්පත් කිහිපයක පළ වී තිබුණි.. 2021-08-06 වැනිදා නිදහස් මාධ්‍ය ව්‍යාපාරයද මෙවැනි අත්අඩංගුවට ගැනීම්වලට විරෝධය පළ කරමින් නිවේදනයක් නිකුත් කළේය.

මූලාශ්‍රය: 1. https://yournews.lk 2. නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ නිවේදනය

7. **පොලිසියෙන් බව පවසමින් මාධ්‍යවේදී තරිඳු උඩුවරගෙදරගේ පෞද්ගලික තොරතුරු ලබා ගැනීම පිළිබඳව ඔහු පොලිස්පතිවරයාට පැමිණිලි කිරීම.**

පොලිසියෙන් බවට හඳුන්වාදෙමින් තම පෞද්ගලික තොරතුරු ලබා ගැනීමේ උත්සාහයක් පිළිබඳව මාධ්‍යවේදී තරිඳු උඩුවරගෙදර අගෝස්තු 24 වැනිදා පොලිස්පතිවරයාට ලිඛිත පැමිණිල්ලක් යොමු කර තිබේ. දැනට මාධ්‍ය කිහිපයකට සම්බන්ධ නිදහස් මාධ්‍යවේදියකු ලෙස කටයුතු කරන ඔහු, ශ්‍රී ලංකා

වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ විධායක කමිටු සාමාජිකයෙකි. රාවය හා අනිද්දා යන පුවත්පත්වල හිටපු කර්තෘ මණ්ඩල සාමාජිකයෙකි.

කොළොන්නාව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට අනුබද්ධව රාජකාරියෙහි නියුතු පොලිස් නිලධාරිනියක ලෙස හඳුන්වා දුන් කාන්තාවක කොවිඩ් එන්නත්කරණය සම්බන්ධව බව පවසමින් තම තොරතුරු ඉල්ලා සිටි බවත්, පසුව අදාළ කාර්යාලයෙන් කළ විමසීමේදී එවැනි තොරතුරු රැස් කිරීමක් සිදු නොකළ බව එම කාර්යාලය තහවුරු කළ බවත් අදාළ පැමිණිල්ලේ සඳහන් වේ.

8. **මාධ්‍ය සාකච්ඡාවකදී කළ ප්‍රකාශ හේතුවෙන් වෛද්‍ය ජයරුවන් බණ්ඩාර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත කැඳවීම.**

වෛද්‍ය පර්යේෂණ ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වෛද්‍ය ජයරුවන් බණ්ඩාර රූපවාහිනී වැඩසටහනකදී කළ අදහස් දැක්වීම් සම්බන්ධයෙන් ඉදිරිපත් වූ පැමිණිල්ලක් මත ඒ මහතාට අගෝස්තු 31 වැනිදා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හමුවේ පෙනී සිටින ලෙස දැනුම් දී තිබිණි. ඔහු වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මඩුල්ලක් එම ප්‍රකාශය දීමට තවත් දින 14ක කාලයක් ඉල්ලා සිටි අතර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඊට එකඟතාව පළ කර තිබේ.

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ දත්ත වාර්තා මකා දැමීමේ සිද්ධිය හා ඖෂධ නිෂ්පාදනය පිළිබඳව වෛද්‍ය ජයරුවන් බණ්ඩාර එම මාධ්‍ය සාකච්ඡාවේදී අදහස් පළ කර ඇති අතර ජාතික ඖෂධ නියාමන අධිකාරියේ සභාපති වෛද්‍ය රසිත විජේවන්ත සහ ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ සභාපති උත්පල චන්ද්‍රවංශ විසින් ඒ පිළිබඳව කළ පැමිණිල්ලක් මත මෙම කැඳවීම සිදු කර තිබිණි.

මූලාශ්‍රය: https://yournews.lk

## නීතිමය කොන්දේසි

**මාධ්‍ය නිදහසට අදාළව නීතිමය කොන්දේසි පිළිබඳ සංරචකය යටතට ගැනෙන සිදුවීම් 6ක් අගෝස්තු මාසය තුළ නිරීක්ෂණය විය. පුරවැසියන්ගේ සංවිධානය වීමේ හා අදහස් පළ කිරීමේ නිදහස උල්ලංඝනය වන ආකාරයෙන් පොලිසිය කටයුතු කිරීමේ ප්‍රවණතාව මේ මාසයේ සිදුවීම්වලින් වඩාත් කැපී පෙනෙයි. පොලිසිය උද්ඝෝෂණ මැඩලීම සඳහා යොදාගත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය අධිකරණයේදී ප්‍රතික්ෂේප වීමද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කොට ඇති භාෂණයේ නිදහස පිළිබඳ අවධාරණය කරමින් අධිකරණය විත්තිකරුවකුට ඇප නියම කිරීමද විශේෂයෙන් නිරීක්ෂණය වූ සාධනීය අවස්ථාවන්ය. අදහස් පළ කිරීමේ නිදහස හා මානව හිමිකම් ආරක්ෂකයින්ගේ දැඩි විරෝධයට හේතු වී ඇති ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ මාධ්‍යවේදියකු දින 90ක කාලයක් රඳවා තබා ගැනීම සඳහා නියෝගයක් ලබා ගැනීමද විශේෂයෙන් අවධාරණය කළ යුතු සිදුවීමකි.**

**ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ජනාධිපතිවරයා විසින් අලුතින් ගැසට් කරන ලද විධිවිධාන අත්හිටුවමින් ශ්‍රේෂ්ඨාධිකරණය අතුරු තහනම් නියෝගයක් නිකුත් කිරීම සාධනීය සිදුවීමකි.**

**3 වගුව: 2021 අගෝස්තු: නීතිමය කොන්දේසි - සිදුවීම් 06**

| අංකය | දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | නීතිමය ක්‍රියාමාර්ග ගැනීම | 04 |
| 02 | මාධ්‍ය නිදහසට ව්‍යවස්ථාමය රැකවරණය | 01 |
| 03 | අධිකරණයේ අපක්ෂපාතීබව | 01 |
| | **එකතුව** | **06** |

1. **ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ නිකුත් කළ නව ගැසට් නිවේදනයට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් අතුරු තහනමක් පැනවීම.**

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ විධිවිධාන යටතේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ විසින් නිකුත් කරන ලද 'දැඩි අන්තවාදී මතවාදවලින් මුදා ගැනීමේ රෙගුලාසි' ක්‍රියාත්මක කිරීම වළක්වාලමින් ශ්‍රේෂ්ඨාධිකරකරණය අගෝස්තු 5 වැනිදා අතුරු නියෝගයක් නිකුත් කළේය. මෙම නියෝගය අගෝස්තු 24 වැනිදා තෙක් බලපැවැත්වෙන පරිදි පනවා තිබුණු අතර, නිරෝධායන ඇඳිරිනීතිය හේතුවෙන් එදින අධිකරණ කටයුතු නොපැවැත්විණි.

මාධ්‍යවේදීන් හා මානව හිමිකම් ක්‍රියාකාරීන් වන රුවන් ලක්නාත් ජයකොඩි, කවින්ද්‍යා ක්‍රිස්ටෝපර් තෝමස්,

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු හා ශිරාන් සනූර විසින් ගොනු කරන ලද මූලික අයිතිවාසිකම් පෙත්සම් 3ක් සලකා බලමින් ශ්‍රේෂ්ඨාධිකරණය මෙම අතුරු නියෝග නිකුත් කර තිබේ. ත්‍රිපුද්ගල ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුල්ලක් හමුවේ මෙම පෙත්සම් සලකා බැලිණි.

මූලාශ්‍රය: https://www.lankaviews.com

2. **උද්ඝෝෂණයකට සහභාගී වී ආපසු යමින් සිටි ගුරුවරුන් 36 දෙනෙකු ඇතුළු 44 දෙනෙකු පොලිසිය මගින් අත්අඩංගුවට ගැනීම.**

සිය ගැටලුවලට විසඳුම් ඉල්ලා අගෝස්තු 04 වැනිදා කොළඹදී විරෝධතාවක නිරතව ආපසු යමින් සිටි මෙම පිරිස අත්අඩංගුවට ගෙන වරාය පොලීසියේ රඳවා තිබූ අතර අගෝස්තු 05 වෙනිදා කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කෙරිණි. ඔවුන් පී.සී.ආර්. පරීක්ෂණවලට ලක් කිරීමට පොලීසිය ඉල්ලා සිටි නමුත් එය ප්‍රතික්ෂේප කළ අධිකරණය, පුද්ගල ඇප මත ඔවුන් මුදාහැරීමට නියෝග කළේය.[1] නඩුව සැප්තැම්බර් 17 වැනිදා යළි කැඳවීමට නියමිතය.

මෙම අත්අඩංගුවට ගැනීම ඇතුළුව භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස උල්ලංඝනය වන ආකාරයට පොලිසිය අනීතිකව සිදු කරන අත්අඩංගුවට ගැනීම් දැඩි ලෙස හෙළා දකිමින් අගෝස්තු 06 වැනිදා මාධ්‍ය නිවේදනයක් නිකුත් කරන නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, මෙමඟින් උත්සාහ කරන්නේ රට තුළ භීතියක් ඇති කරමින් පොදු ප්‍රශ්න සම්බන්ධයෙන් ජනතාව නගන හඬ යටපත් කිරීමටදැයි ප්‍රශ්න කරයි.

අගෝස්තු 3 වැනිදා කොතලාවල පනතට එරෙහි උද්ඝෝෂණයට සම්බන්ධ වූ අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බලමණ්ඩලයේ කැඳවුම්කරු වසන්ත මුදලිගේ, දේශපාලන ක්‍රියාකාරිකයන් වන චමීර කොස්වත්ත සහ කෝෂිලා හංසමාලි, ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ මහා ශිෂ්‍ය සංගමයේ සභාපති අමිල සන්දීප යන අය අත්අඩංගුවට ගැනීම පිළිබඳවද නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සිය විරෝධය පළ කර ඇත.[2]

මූලාශ්‍රය: 1 https://www.youtube.com 2. එම නිවේදනය

3. **සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල්වරයා විසින් පොලිස්පතිවරයා වෙත යොමු කරන ලද ලිපිය ප්‍රකාරව උද්ඝෝෂණයක් තහනම් කිරීමට පොලිසිය කළ ඉල්ලීමක් අධිකරණය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීම.**

විරෝධතා වැළැක්වීමට පොලිසිය භාවිත කළ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය නීතියක් ලෙස පිළිගත නොහැකි බවත්, එය පදනම් කරගෙන විරෝධතා තහනම් කළ නොහැකි බවත් ගම්පහ ප්‍රධාන මහේස්ත්‍රාත් මංජුල කරුණාරත්න මහතා තීන්දුවක් ලබා දෙමින් ප්‍රකාශ කර ඇත. ගුරු විදුහල්පති වැටුප් විෂමතාවට එරෙහිව සංවිධානය කර ඇති උද්ඝෝෂණ පාගමන වළක්වමින් නියෝගයක් නිකුත් කරන ලෙස අගෝස්තු 6 වැනිදා බෙම්මුල්ල පොලිස් ස්ථානාධිපතිවරයා කළ ඉල්ලීම ප්‍රතික්ෂේප කරමින් මෙම තීන්දුව දී තිබේ.[1]

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 වැනි ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති සාමකාමීව රැස්වීම, අදහස් ප්‍රකාශ කිරීම, ශ්‍රී ලංකාව තුළ අභිමත ස්ථානයක් වෙත යාමේ ඒමේ නිදහස ආදිය සීමා කළ හැක්කේ ව්‍යවස්ථාවේ 15 වැනි ව්‍යවස්ථාව අනුව පමණක් බවත්, ඒ අනුව එය සිදු කළ හැක්කේ පවත්නා නීතියෙන් ප්‍රතිපාදන දක්වා ඇත්නම් පමණක් බවත්, ජූලි 6 වැනිදා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා පොලිස්පතිවරයාට යවන ලිපියෙහි සඳහන් කරුණු 1987 අංක 03 දරන නිරෝධායන හා රෝග වැළැක්වීමේ ආඥා පනතේ 2 සහ 3 වගන්ති ප්‍රකාරව සාදන ලද සෞඛ්‍ය රෙගුලාසි වශයෙන් සැලකිය නොහැකි බවත් මහේස්ත්‍රාත්වරයා සිය නියෝගයේ සඳහන් කර තිබේ.

පසුගිය සති කිහිපයේ පැවති විරෝධතා උද්ඝෝෂණ ආදිය වැළැක්වීම සඳහා පොලිසිය විසින් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ඉහත ලිපිය උපයෝගී කර ගත් අතර එය නීතිඥ සංගමය ඇතුළු බොහෝ පාර්ශ්වවල විවේචනයට ලක්ව තිබිණි.

මූලාශ්‍ර: https://medialk.com

4. **ලංකා ඊ නිව්ස් වෙබ් අඩවියේ මාධ්‍යවේදී කීර්ති රත්නායක අත්අඩංගුවට ගෙන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ දින 90ක රැඳවුම් නියෝගයක් මත රඳවා තබා ගැනීම.**

ලංකා ඊ නිව්ස් වෙබ් අඩවියේ මාධ්‍යවේදියකු වන කීර්ති රත්නායක ඉන්දීය මහකොමසාරිස් කාර්යාලයට ලබා දුන් තොරතුරක් ගැන පොලිසිය විසින් සිදු කෙරෙන පරීක්ෂණයකට අදාළව අගෝස්තු 14වැනිදා කොල්ලුපිටිය පොලිසියට කැඳවා තිබූ අතර එහිදී CCDය විසින් ඔහු අත්අඩංගුවට ගන්නා ලදි. මුලදී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ දින 3ක කාලයක් සඳහා ලබාගත් රැඳවුම් නියෝගයක් මත ඔහු රඳවා තබා ගත් අතර පසුව එය දින 90ක් දක්වා දීර්ඝ කෙරිණි. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතට ගැනෙන කවර චෝදනාවක් සම්බන්ධයෙන් ඔහු රඳවා තබා ගන්නනේද යන්න CCDය පැහැදිලි කර නැතැයි ඔහුගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් පෙනී සිටින නීතිඥ උපුල් කුමාරප්පෙරුම ප්‍රකාශ කරයි.

අත්අඩංගුවේ සිටින කීර්ති රත්නායක මහනුවර රැගෙන යෑමට CCDය සැලසුම් කර ඇති බවත් එය ඔහුගේ ජීවිතයට අනතුරක් බැවින් ඔහුගේ ජීවිතාරක්ෂාව සඳහා මැදිහත් වන ලෙසත් නීතිඥ උපුල් කුමරප්පෙරුම නීතිඥ සංගමයට දැනුම් දෙන ලදුව, නීතිඥ සංගමයේ සභාපතිවරයා විසින් ඒ පිළිබඳව මානව හිමිකම් කොමිසමටත් පොලිස්පතිවරයාටත් දැනුම් දී ඇත.

ඔහුව මහනුවර නිවසට රැගෙන යෑම ඒ නිසා වැළකී තිබුණි. මෙම අත්අඩංගුවට ගැනීමට විරෝධය පළ කරමින් නිවේදනයක් නිකුත් කරන හිටපු කතානායක කරු ජයසූරිය ප්‍රකාශ කරන්නේ මෙය 'පණිවිඩකරු අත්අඩංගුවට ගැනීමක්' බවයි.[1]

මේ සම්බන්ධයෙන් පොලිස්පතිවරයාට ලිපියක් යොමු කරන නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඇතුළු මාධ්‍ය සංවිධාන එකමුතුව, කීර්ති රත්නායක අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් හේතු පැහැදිලි කරන ලෙස ඉල්ලා සිටියේය.[2] මේ පිළිබඳව අගෝස්තු 26 වැනිදා නිවේදනයක් නිකුත් කරන ජනමාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සම්මේලනය (IFJ) මාධ්‍යවේදීන් නිහඬ කිරීමේ ක්‍රමවේදයක් ලෙස ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත භාවිත කිරීම නතර කරන ලෙසත්, අත්අඩංගුවට ගත් කීර්ති රත්නායක වහා නිදහස් කරන ලෙසත් රජයට බල කර සිටී.[3]

මූලාශ‍්‍ර: 1. https://len-official.blogspot.com 2. https://sinhala.srilankabrief.org 3. https://www.ifj.org

5. **සමාජමාධ්‍ය ක්‍රියාකාරිනියක වන තුෂාරා වන්නිආරච්චිගේ නිවස පරීක්ෂා කළ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඇයට අයත් සන්නිවේදන උපකරණ අත්අඩංගුවට ගැනීම හා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත කැඳවා ඇයගෙන් ප්‍රශ්න කිරීම.**

සමාජමාධ්‍ය ක්‍රියාකාරිනියක වන තුෂාරා වන්නිආරච්චිගේ නිවස සීඅයිඩී නිලධාරීන් විසින් අගෝ.15 වැනිදා අලුයම 3ට පමණ පරීක්ෂා කොට ඇගේ ලැප්ටොප් පරිගණකය, දුරකථන, මෙමරි පෙන් ආදිය අත්අඩංගුවට ගෙන ඇති අතර 16 වැනිදා දෙවන වරටත් කණ්ඩායමක් පැමිණ ප්‍රශ්න කර තිබේ.[1] ඇයගේ නිවස සෝදිසි කිරීම හා උපකරණ රැගෙන යෑමට අදාළව නීතිමය තත්ත්වය පැහැදිලි කිරීමට පොලිසිය අපොහොසත් වී ඇති අතර, ඒ සඳහා අධිකරණ නියෝගයක් ලබා ගැනීමක් හෝ අධිකරණයට කරුණු වාර්තා කිරීමක් සිදු කර නැත. අත්අඩංගුවට ගත් භාණ්ඩ සම්බන්ධයෙන් රිසිට්පතක් ලබා දී තිබේ. අගෝස්තු 17වැනිදා ඇය කොළඹ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ප්‍රශ්න කෙරුණු අතර ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවාගෙන සිටින ලංකා ඊ නිව්ස් මාධ්‍යවේදී කීර්ති රත්නායක සම්බන්ධයෙන් කරන විමර්ශනවලට අදාළව මෙම ප්‍රශ්න කිරීම සිදු කර ඇත.

කීර්ති රත්නායක අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් මාධ්‍ය සංවිධාන එකතුව පොලිස්පතිවරයාට යොමු කළ ලිපියෙහි තුෂාරා වන්නිආරච්චිට අදාළ සිදුවීම ගැනද සඳහන් කර ඇති අතර, ජනමාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සම්මේලනය නිකුත් කළ නිවේදනයෙහිද මෙම සිදුවීම සම්බන්ධයෙන් ප්‍රශ්න කර තිබිණි.[2]

මූලාශ‍්‍ර: 1. https://facebook.com 2. https://www.ifj.org

6. **ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ජාතික සේවක සංගමයේ සභාපති ආනන්ද පාලිත ජනමාධ්‍යයට කළ ප්‍රකාශයක් හේතුවෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගැනීම හා භාෂණයේ නිදහස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති බව අවධාරණය කරමින් අධිකරණය ඔහුට ඇප නියම කිරීම.**

රට තුළ ඉන්ධන හිඟයක් ඇති බවට අගෝස්තු 19 වැනිදා මාධ්‍ය හමුවකදී අසත්‍ය ප්‍රකාශයක් සිදු කළේය යන චෝදනාව මත ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ජාතික සේවක සංගමයේ සභාපති ආනන්ද පාලිත 20 වැනිදා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගැනිණි.[1]

22 වැනිදා අලුත්කඩේ මහේස්ත්‍රාත් අධිකරණය හමුවට ඉදිරිපත් කෙරුණු ඔහු ලක්ෂ 10 බැගින් වූ ශරීර ඇප දෙකක් මත නිදහස් කරන ලදි. පොලිසිය ඇප දීමට විරුද්ධව කරුණු ඉදිරිපත් කළ නමුත්, නියෝගය ප්‍රකාශයට පත්කරමින් අතිරේක මහේස්ත්‍රාත් ලෝචනා අබේවික්‍රම මහත්මිය සඳහන් කර ඇත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (1) ව්‍යවස්ථාව යටතේ ජනතාවට භාෂණයේ නිදහස සහතික වී ඇති හෙයින් සත්‍ය තොරතුරු පදනම් කරගෙන අදහස් ප්‍රකාශ කිරීම රිමාන්ඩ් භාරයේ තබා ගත යුතු කරුණක් නොවන බවයි.[2]

ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ කළමනාකාරවරයෙකු විසින් සිදු කළ පැමිණිල්ලකට අදාළව සිදුකරන විමර්ශන යටතේ ආනන්ද පාලිත අත්අඩංගුවට ගත් අතර පොලිසිය අධිකරණය හමුවේ ප්‍රකාශ කර ඇත්තේ ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් ඉන්ධන තොග පිළිබඳව ඔහු ප්‍රකාශ කළ තොරතුරු හේතුවෙන් මහජනයා අතර කැලඹීමක් ඇති කළ බවයි.

මෙහිදී ආනන්ද පාලිත වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ ශ්‍රීනාත් පෙරේරා ඇතුළුව ජනාධිපති නීතිඥවරුන් 7 දෙනෙකුගෙන් යුත් නීතිඥ කණ්ඩායම පෙන්වා දී ඇත්තේ අදාළ මාධ්‍ය හමුව හේතුකොටගෙන ජනතාව කැලඹීමට පත් නොවූ අතර, මින් පෙර විෂයභාර අමාත්‍යවරයා ඛනිජ තෙල් අරපිරිමැස්මෙන් භාවිත කරන ලෙසට කළ ප්‍රකාශයත් ආනන්ද පාලිත විසින් මාධ්‍ය හමුව පැවැත් වූ දිනට පසුදින රට වසාදමන බවට ජනාධිපතිවරයා විසින් සිදුකළ ප්‍රකාශයත් පදනම් කරගෙන ජනතාව ඉන්ධන ලබාගැනීම සඳහා කටයුතු කළ බවය.

ආනන්ද පාලිත ප්‍රකාශ කළ තොරතුරු ඔහු ලබාගෙන ඇත්තේ ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් පවත්වාගෙන යනු ලබන දත්ත ගබඩාවෙන් බවද නීතිඥවරුන් අධිකරණය හමුවේ පෙන්වා දී තිබිණි.

මූලාශ‍්‍ර: 1. https://newswave.lk 2. https://www.newsfirst.lk

## වායුහාත්මක කොන්දේසි

**'වායුහාත්මක කොන්දේසි' යන්න මාධ්‍ය නිදහස පිළිබඳව සලකා බැලෙන වැදගත් සංරචකයකි. මාධ්‍ය පද්ධතියේ සමස්ත වායුහයට මෙන්ම මාධ්‍ය නිදහස සක්‍රිය කරන සමස්ත පරිසරයට අදාළ වන විභව දර්ශක 6ක් මෙම මානයට ඇතුළත්ය. ඒ අතරින් 'අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය' යන දර්ශකයට අයත් වන අවස්ථා තුනක් අගෝස්තු මාසයේදී නිරීක්ෂණය විය. ඉන් දෙකක් නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ මැදිහත්වීමෙන් සිදු කෙරුණු කාර්යයන්ය.**

**4 වගුව: 2021 අගෝස්තු: වායුහාත්මක කොන්දේසි - සිදුවීම් 03**

| අංකය | දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය | 03 |
| | **එකතුව** | **03** |

1. **ශ්‍රී ලංකාවේ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාත්මක වී වසර පහක් සම්පූර්ණ වීම නිමිත්තෙන්, ශ්‍රී ලංකා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව, මහජන සුබසිද්ධිය පිළිබඳ තෝරා ගත් නියෝග එකතුවක් එළිදැක්වීම.**

   අගෝස්තු 4 වැනිදා ශ්‍රී ලංකාවේ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාත්මක වී වසර පහක් සපිරීම නිමිත්තෙන්, ශ්‍රී ලංකා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව මහජන සුබසිද්ධිය පිළිබඳ තෝරා ගත් නියෝග, අන්තර්ගත මාතෘකා යටතේ සුචිගත කළ දත්ත එකතුවක් මහජනතාවගේ පරිශීලනය සඳහා නිකුත් කළේය.

   එක්සත් ජාතීන්ගේ ප්‍රධාන තිරසර සංවර්ධන දර්ශක අනුව වර්ගීකරණය කර වගුගත කරන ලද 2020 වර්ෂය තුළ ලබා දුන් ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ නියෝග 597ක්ද[1] (සිංහල සාරාංශ) 2017-2020 කාලය තුළ ලබා දුන් ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ නියෝග 1,773ක (ඉංග්‍රීසි) සාරාංශ එකතුවක්ද[2] ඒ අතර වෙයි.

   මූලාශ්‍ර:

   1. http://www.rticommission.lk පිටුව 1
   2. http://www.rticommission.lk පිටුව 2

2. **නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සම්පාදනය කළ, '2020 ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහස වාර්ෂික වාර්තාව - සිදුවීම් සහ ප්‍රවණතා' එළිදැක්වීම.**

   2020 වසරේ ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහස සම්බන්ධයෙන් නිදහස් මාධ්‍ය ව්‍යාපාරය විසින් සකස් කළ වාර්ෂික වාර්තාව භාෂා තුනෙන්ම එළිදැක්විණි. අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය ඇතුළු මාධ්‍ය නිදහසට සම්බන්ධ ගෙවුණු වසරේ සිදුවීම් සහ ප්‍රවණතා මෙන්ම ඒ පිළිබඳ විශ්ලේෂණයක්ද මෙම වාර්තාවට ඇතුළත් වේ. නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වෙනුවෙන්, එහි විධායක කමිටු සාමාජික නීතිඥ විරංජන හේරත් විසින් මෙම වාර්තාව සම්පාදනය කෙරිණි.

   අදාළ වාර්තාව http://www.fmmsrilanka.lk

3. **නිදහස් මාධ්‍ය ව්‍යාපාරය මාසිකව සංවිධානය කරන සංවාද මාලාවක ආරම්භක සංවාදය 'අදහස් පළ කිරීමේ නිදහස සහ මර්දනය' යන තේමාව යටතේ පැවැත්වීම.**

   නිදහස් මාධ්‍ය ව්‍යාපාරය විසින් මාසිකව පළ කරනු ලබන 'මාධ්‍ය නිදහස නිරීක්ෂණ වාර්තාව' මගින් ඉකුත් මාස 7ක කාලය තුළ ආවරණය කළ සිදුවීම්ද පාදක කර ගනිමින් සැලසුම් කෙරුණු මෙම සංවාදය අගෝස්තු මස 25 වැනි බදාදා සවස 4.00 - 6. 00 දක්වා අන්තර් ජාලය ඔස්සේ පැවැත්විණි. ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ විධායක සභික ජ්‍යෙෂ්ඨ නීතිඥ උපුල් කුමාරප්පෙරුම, නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ විධායක කමිටු සාමාජික නීතිඥ විරංජන හේරත් සහ සමාජ ක්‍රියාකාරිනී නීතිඥ කෞෂල්‍යා ආරියරත්න මෙහිදී අදහස් දැක්වූ අතර සංවාද මණ්ඩපය සියලු සහභාගිකයන්ට විවෘත විය. මාධ්‍ය නිදහස ඇතුළුව අදහස් පළකිරීමේ නිදහසට එල්ල වී ඇති අභියෝග හමුවේ සාමූහිකව විසඳුම් සෙවීමේ අවශ්‍යතාව එහිදී විශේෂයෙන් අවධාරණය කෙරිණි.

**5 වගුව: මාධ්‍ය නිදහස: 2021 ජනවාරි-අගෝස්තු දක්වා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වෙත වාර්තා වී ඇති සිදුවීම්**

| ආවරණය කර ඇති සංරචකය | 2021 ජනවාරි - ජූලි | | 2021 අගෝස්තු |
|---|---|---|---|
| | පෙර සිදුවීම් | පෙර සිදුවීම්වල වර්ධනයන් | |
| ආරක්ෂාව හා සුරක්ෂිතබව | 29 | | 08 |
| නීතිමය කොන්දේසි | 31 | 04 | 06 |
| මාධ්‍ය ස්වාධීනත්වය | 02 | | - |
| මාධ්‍ය නිදහස සම්බන්ධ ප්‍රවණතා | 01 | | - |
| ව්‍යුහාත්මක කොන්දේසි | 03 | | 03 |
| **එකතුව** | **66** | **04** | **17** |

2021 මාධ්‍ය නිදහස මාසික වාර්තා ජනවාරි-ජූලි දක්වා මෙතැනින් බලන්න

**පසුසටහන:** සිවිල් සමාජ අපේක්ෂාවන්, ජාතික හා ජාත්‍යන්තර නඩු තීන්දු සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්ටද අනුව යමින්, මාධ්‍ය නිදහස යනු මානව අයිතියක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. සෑම තැනැත්තකුම සතු සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස මෙන්ම අන් තැනැත්තන්ගේ මත දැනගැනීමට තිබෙන මූලික අයිතිය බාධාවකින් තොරව භුක්තිවිඳීම මානව අයිතියකි. මෙම පදනම මත පිහිටා මාධ්‍ය නිදහස යනු පහත දැක්වෙන දසවැදෑරුම් සංඝටකවල එකතුවක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සලකයි. (1) සිතීමේ නිදහස (2) මතයක් දැරීමේ නිදහස (3) භාෂණයේ නිදහස (4) සාමකාමීව රැස්වීමේ නිදහස ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස (5) තොරතුරු දැනගැනීමේ නිදහස (6) ශ්‍රව්‍ය, දෘශ්‍ය පටිගත කිරීමේ සහ වාර්තා තබා ගැනීමේ නිදහස (7) ප්‍රකාශනයේ නිදහස (8) පුවත්පත් නිදහස (9) විද්‍යුත් මාධ්‍ය නිදහස (10) අන්තර්ජාල නිදහස යනු එම සංඝටකයන්ය. මෙම සංඝටක අතර ඇත්තේ සහජීවී සම්බන්ධයක් වන අතර එක් සංඝටකයක ඇති වන සීමාවක් මාධ්‍ය නිදහස පිළිබඳ අනෙක් සියලුම සංඝටකයන් භුක්තිවිඳීමේ නිදහස අහුරන බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. එමෙන්ම වගකීම් විරහිතව හා වෛරී සහගත ලෙස එම නිදහස භාවිත කිරීම යහපත් භාවිතාවක් නොවන බවද නිදහස් මාධ්‍ය ව්‍යාපාරය අවධාරණය කරයි.

මෙම මාසික වාර්තා පිළියෙල කරනු ලබන්නේ ජනමාධ්‍ය වාර්තා සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයට ලබා ගත හැකි තොරතුරු අනුව වැඩිදුර තොරතුරු සොයා එම සිදුවීම් විශ්ලේෂණය කිරීමෙනි. මෙම විශ්ලේෂණයේදී නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඉහත කී දසවැදෑරුම් මාධ්‍ය නිදහස් සංඝටකයන් ආවරණය කරන ජාත්‍යන්තරව පිළිගත් සංරචකයන් හතක් ඔස්සේ තෝරා ගත් නිර්ණායක භාවිත කරයි.


Free Media Movement
Convener | Seetha Ranjanee +94 77 731 2460 | Secretary | Lasantha De Silva +94 71 166 7938
Treasurer | Thaha Muzammil +94 77 374 1026
No 96, Bernard Soysa Mw, Colombo 05. Tel: +94 112368895 Fax: +94 112368895;
Web: www.fmmsrilanka.lk, www.mediareform.lk
Email: fmmsrilanka@gmail.com | Facebook: https://www.facebook.com/fmm.srilanka
Twitter: https://twitter.com/FMMsrilanka | #FMM25


Layout: Nalinda Seneviratne